museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2022 ජූනි

# අධ්‍යාපනය සඳහා ප්‍රේක්ෂක සහභාගීත්වයෙන් යුතු ප්‍රවේශයක්: ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කෞතුකාගාරය

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කෞතුකාගාරයේ (MMCA ශ්‍රී ලංකා) 'මුණගැසීම්' ප්‍රදර්ශනය සිය වටමාරු තුනෙන් පළමුවැන්න 2022 මැයි 22 අවසන්කළේ ය. සියලු වයස්වල ප්‍රේක්ෂකයන් සහභාගීකරගැනීම උදෙසා සංදර්ශිත කලාකෘතිවලින් ආභාසය ලබාගත් මහජන වැඩසටහන් 37ක් නොමිලේ පැවැත්විණි. මහජන වැඩසටහන් MMCA ශ්‍රී ලංකාහි කාර්ය මණ්ඩලය මගින් විශේෂයෙන් අභිරක්ෂණයකෙරෙන අතර, ඒවා ගැලරියේ සංදර්භය සමග ප්‍රේක්ෂකයන්ගේ ගනුදෙනුව ගොඩනගයි.

ප්‍රදර්ශනය ආරම්භවූයේ 'Athi Vishesha (Extra Special)' (2008) නම් සිය කලාකෘතිය ගැනත්, එය මිත්‍රත්වය හා ආදරය යන අදහස්වලට සම්බන්ධවන ආකාරය ගැනත් ප්‍රදීප් තලවත්ත (උ. 1979) කලාකරුවාගේ අදහස්දැක්වීම සමග ය. ප්‍රදීප්ගේ කලාකෘතිය ජෝජ් කීට්ගේ (1901–1993) 'The Friends' (1982) නම් සිතුවම සමග 'මුණගැසීම්හි' පළමු වටමාරුවේ සංදර්ශිතවිය. කලා ඉතිහාසඥ ටී. සනාතනන් විසින් එම වටමාරුවේ ම සංදර්ශිත '(வாழ்க்கை) கைவினைஞன்' ((ජීවිතය) කර්මාන්ත ශිල්පියා) (1970) නම් කෘතිය සිතුවම්කළ අසායි රාසයියාට (1946–2020) උපහාර දැක්වීම ද නරඹන්නන්ට ඇසීමට අවස්ථාව හිමිවිය. මෙය ඔහුගේ නිර්මාණ ගැන 2020 ඔහුගේ අභාවයෙන් පසු පැවති පළමු මහජන කථාවයි. ජෝජ් කීට් ගැන සහ, ඔහුගේ ව්‍යවහාරයේ විශේෂ භූමිකාවක් දැරුවා වියහැකි පෞද්ගලික හා වෘත්තිමය බලපෑම් ගැන ද කතාබහක් කලා අනුග්‍රාහක මාලක තල්වත්ත සහ ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරෙයිරා අතර සිදුවුණි. මේ සියලු වැඩසටහන් සඳහා වෙන්කළ ආසන සියල්ල විකිණීයාමෙන් පෙනීයන්නේ වඩා වැඩි විවේචනාත්මක අවධානයක් ලැබිය යුතු කලාකරුවන් සමග හා ඔවුන් ගැන සංවාදවල නියැලීමට දේශීය ප්‍රේක්ෂකයන්ගේ ඇති විශාල උනන්දුවයි. 2022 ඔක්තෝම්බර් 19 විවෘතවන 'මුණගැසීම්හි' තුන්වන වටමාරුවේ ද කීට්ගේ නිර්මාණ යළි දැකගතහැකි නිසා, වෙනස්වන සංදර්ශක තුළින් ඔහුගේ ව්‍යවහාරය පදනම්කරගත් තවත් මහජන වැඩසටහන් කෞතුකාගාරයේ පැවැත්වෙනු ඇත.

ආදරය හා කුලුපඟබව පදනම්කරගත් තේමා යටතේ කවි කියවීම් හතරක් ද MMCA ශ්‍රී ලංකා සංවිධානයකළේ ය. මාලින්ද සෙනවිරත්න, විවිමරි වැන්ඩපූටින්, වූසතී ලියනාරච්චි, සුරේඛා සමරසේන, සෞම්‍ය සඳරුවන් ලියනගේ, සහ අනාර් යන කවීන් දෙවන සංදර්ශකයේ කලාකෘතිවලට ඉංග්‍රීසි, සිංහල, හා දමිළ කවිවලින්

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

ප්‍රතිචාරදැක්වූවේ ය. ඕපන් මයික් වැඩසටහනකදී අවුරුදු 16–21 අතර තරුණ හා නැගීඑන කවීන් 'කුලුපඟබව' යන තේමාව යටතේ සිය කවි කියෙව්වේ ය. මේ කවි වැඩසටහන් නිර්මාණකරුවන් 40 දෙනෙකු එකටගෙනා අතර, නූතන හා සමකාලීන කලාව පිළිබඳ උනන්දුව කවි සහ වාචික වචනය සමග සම්බන්ධවන ආකාරය හුවාදැක්වූවේ ය.

"ප්‍රේක්ෂකයන්ට අර්ථවත් ලෙස කලාව සමග ගනුදෙනුකිරීමට ඉඩ ලබාදෙන වෙනස් ආකාරයේ අත්දැකීම් අභිරක්ෂණයකිරීම වැදගත්. අපිට කෞතුකාගාරවලට යන මහජනතාවක් ශ්‍රී ලංකාවේ බිහිකිරීමට උවමනායි. නිතිපතා පැවැත්වෙන වැඩසටහන් සහ සැමට නොමිලේ සම්බන්ධවිය හැකි අත්දැකීම් හරහා මේ ඉලක්කය දීර්ඝකාලීනව ළඟාකරගැනීමට අපි බලාපොරොත්තුවෙනවා" යැයි අධ්‍යාපන හා මහජන වැඩසටහන් සහාය අභිරක්ෂක ප්‍රමෝධා වීරසේකර පැවසුවා ය. මහජන වැඩසටහන්වල ආයෝජනයකිරීම නූතන හා සමකාලීන කලාවෙන් සමස්ත සමාජයට කළහැකි බලපෑම සඳහා අත්‍යවශ්‍ය යැයි සිතන යුරෝපා සංගමය, කලා කටයුතු පිළිබඳ පදනම (Foundation for Arts Initiatives), සහ ජෝන් කීල්ස් පදනම මගින් මේ වැඩසටහන් සියල්ලට අරමුදල් සැපයේ.

ළාබාල ප්‍රේක්ෂකයන්ට වැඩමුළු ස්වරූපයෙන් ක්‍රියාකාරකම් පදනම්කරගත් ඉගෙනුම් අත්දැකීම් ලබාදීමට ද MMCA ශ්‍රී ලංකාහි මහජන වැඩසටහන් අරමුණුකරයි. උදාහරණයකට, 'කියවන මුද්දර' විසින් මෙහෙයවූ වැඩමුළුවක් මගින් ශ්‍රී ලංකාවේ විශේෂ අවස්ථාවලදී නිකුත්කෙරුණු මුද්දර හරහා ඉතිහාසය ඉගෙනීමට තරුණ වැඩිහිටියන්ව පුහුණුකෙරුණි. නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය නාභිගතකරගත් මුද්දර එකතුවක් 2023 ජනවාරි 8 දක්වා සංදර්ශිත පළමු සංදර්ශකයේ ඇතුළත් ඒකදෛනික වස්තු අතර වෙයි. එසේ ම, බෙහෙවින් කතාබහට ලක්වූ, පළමු වටමාරුවේ කොටසක් ලෙස සංදර්ශනයවූ සමකාලීන කලාකරු සුසිමාන් නිර්මලවාසන්ගේ (උ. 1982) 'White Curtain and Women' (2016) කලාකෘතියෙන් අභාසය ගෙන රෙදි, මැසුම්, හා එම්බ්‍රොයිඩරි යොදාගෙන කතාන්දර කීම පිළිබඳ වැඩමුළුවක් සබීන් ඕමාර් සහ ශාදියා ජමල්දීන් යන කලාකරුවන් පැවැත්වීය. අධ්‍යාපන හා මහජන වැඩසටහන් සම්බන්ධීකාරක ශාමි තවයෝගරජා වැඩමුළු ගැන මෙසේ පැවසීය: "නරඹන්නන් සම්බන්ධවන්නේ ඉතිහාසයේ සිට කලා මාධ්‍යයන් දක්වා විවිධ දේවල් ඉගෙනගැනීමේ අපේක්ෂාවෙන්. වෙහෙසකර වැඩ දවසකින් පසු විවේකගන්නට මැහුම් සහ එම්බ්‍රොයිඩරි වගේ දේවල් ඉගෙනගන්නටත් ඔවුන් කැමතියි. එවැනි වැඩමුළු හරහා ප්‍රදර්ශන අවකාශය වඩාත් ක්‍රියාශීලිවනවා වගේ ම සහභාගිවන්නන් නොදැනුවත්ව ම සංදර්ශිත කලාකෘති සමග ගනුදෙනුකරනවා."

මහජන වැඩසටහන්වලට අමතරව, සිසුන්ගේ විෂය නිර්දේශ අවශ්‍යතාවලට අනුකූලව ඔවුන් වෙනුවෙන් කෞතුකාගාර සංචාර සංවිධානය කිරීමට ද MMCA ශ්‍රී ලංකා පාසැල් හා විශ්වවිද්‍යාල සමග සෘජුව ම කටයුතුකරයි. 'මුණගැසීම්හි' පළමු මාස තුනේදී කෞතුගාරයට පාසැල් සිසුන් 78ක් හා විශ්වවිද්‍යාල සිසුන් 116ක් පිළිගැණුනි. MMCA ශ්‍රී ලංකාහට "පාසැල් කාලයෙන් පසු මිතුරන් සමග යළි කෞතුකාගාරයට පැමිණීමට සිසුන්ව දිරිමත්කරන, ප්‍රත්‍යවේක්ෂනය, ඇවිදමින් කාලය ගතකිරීම, සහ කෙළිලොල්බව සමග ඉගෙනුම අතිනත යන පන්තිකාමර ලෙස කෞතුකාගාරයේ ගැලරි දැකිය හැකි" ආකාර ගැන අභිරක්ෂක සන්දෙව් හැන්ඩි උනන්දුවෙයි. ප්‍රදර්ශන අභිරක්ෂකයෙන්ගෙන් පමණක් නොව අධ්‍යාපනයේ, ඉගෙනුමේ හා පුහුණුවීමේ අභිරක්ෂකයන්ගෙන් ද MMCA

ශ්‍රී ලංකා කණ්ඩායම සැදී ඇත. විධිමත් අධ්‍යාපන අංශය සමග MMCA ශ්‍රී ලංකාහට කටයුතුකළ හැකි විවිධ ආකාර පිළිබඳව සහ, සිසුන් කෞතුකාගාර කර්මාන්තය වෘත්තීය මාර්ගයක් ලෙස දකින ආකාරය ගැන MMCA ශ්‍රී ලංකා කාර්යමණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙක් පාසැල් ගුරුවරුන් හා විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් සමග අඛණ්ඩව සංවාදයේ යෙදීසිටියි.

කෞතුකාගාරයට ඇතුල්වීම සහ එහි සියලු වැඩසටහන් ගාස්තුවකින් තොර ය. කෞතුකාගාරයේ වෙබ් අඩවියවන www.mmca-srilanka.org/ සහ, සමාජ මාධ්‍යවන ෆේස්බුක් www.facebook.com/mmcasrilanka හා ඉන්ස්ටග්‍රෑම් www.instagram.com/mmcasrilanka/ හරහා අපගේ වැඩසටහන් පිළිබඳව යාවත්කාලීනවීමට නරඹන්නන්ව උනන්දුකරන්නෙමු. අපගේ අධ්‍යාපන හා මහජන වැඩසටහන් පිළිබඳ යම් විමසුමක් තිබේ නම් education@mmca-srilanka.org වෙත ලිවීමට ද හැක.